# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2085/20 - 2018 අගෝස්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්.ඩී.බී.15/2014

## රජයේ නිවේදන

### 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 58 වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 38 වන වගන්තිය යටතේ නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**සජිත් ප්‍රේමදාස,**
නිවාස සහ ඉදිකිරීම් අමාත්‍ය

2018 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2018 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා කාර්ය පටිපාටි සහ ප්‍රමිති) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ලියාපදිංචි වී ඇති සෑම කොන්ත්‍රාත්කරුවකු ම එම පනත යටතේ යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක්, පිළිවෙළින්, පළමු හා දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති කාර්ය පටිපාටි හා ප්‍රමිතිවලට අනුකූලව සිදු කළ යුතු ය.

3. මෙම නියෝගවල -
"හඳුනාගත් ඉදිකිරීම් වැඩ යන්නට", 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

1A - PG 4180 - 507 (2018/08)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමු උපලේඛනය

## හඳුනාගත් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීමේ කාර්ය පටිපාටිය

1. සෑම හඳුනාගත් ඉදිකිරීම් වැඩක් ම දෙවන උපලේඛනයෙහි සඳහන් අදාල සම්මත කොන්දේසි සහ පිරිවිතරවල දක්වා ඇති නියමිත තත්ත්වයන් ට සහ ශිල්පීය ක්‍රමවලට අනුකූල ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

   එසේ යම් සම්මත කොන්දේසි හෝ පිරිවිතර ලේඛනගත කර නොමැති අවස්ථාවක දී, එවැනි ඉදිකිරීම් වැඩ අන්තර්ජාතික වශයෙන් පිළිගත්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද කොන්දේසි හෝ පිරිවිතරවලට අනුකූලව සිදු කළ යුතු ය.

2. ස්ථිර වැඩවල දී භාවිත කරනු ලබන සෑම ද්‍රව්‍යයක් ම හෝ ස්ථාපනය කරන ලද යන්ත්‍රෝපකරණයක් ම ලියාපදිංචි ආනයනකරුවකු, සැපයුම්කරුවකු හෝ නිෂ්පාදකයකු විසින් සපයනු ලැබිය යුතු අතර, එම සෑම ද්‍රව්‍යයක් ම සහ යන්ත්‍රෝපකරණයක් ම නියමිත පිරිවිතරවලට අනුකූල විය යුතු ය.

3. කිසියම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් ඉටු කිරීමේ දී වෘත්තීයමය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග මගින් සහතික කළ යුතු ය.

4. වැඩබිම තුළ හෝ ඉන් පිටත පරිසරය ආරක්ෂා කිරීමට සහ පරිසර දූෂණය, ශබ්ද දූෂණය හෝ වෙනත් හේතුවක් නිසා පුද්ගලයන් ට හෝ අවට යම් දේපළකට වන හානි හෝ පීඩා වැළැක්වීමට, ප්‍රමාණවත් සහ සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

5. සියලු ඉදිකිරීම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආපදා ප්‍රත්‍යස්ථතික ක්‍රියාමාර්ගයන් යොදා ගැනීමට ප්‍රමාණවත් සහ සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

## දෙවන උපලේඛනය

## හඳුනාගත් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රමිති

| | | | |
|---|---|---|---|
| 1. | CIDA/SBD/01 | - | සම්මත ලංසු ලේඛනය - වැඩ ප්‍රසම්පාදනය. |
| 2. | CIDA/SBD/02 | - | සම්මත ලංසු ලේඛනය - විශාල පරිමාණයේ කොන්ත්‍රාත්තු. |
| 3. | CIDA/SBD/03 | - | සම්මත ලංසු ලේඛනය - සුළු පරිමාණයේ කොන්ත්‍රාත්තු. |
| 4. | CIDA/SBD/04 | - | සම්මත ලංසු ලේඛනය - නිර්මාණය කර ඉදි කිරීමේ කොන්ත්‍රාත්තු. |
| 5. | CIDA/ID/11 | - | ගොඩනැගිලි අත්තිවාරම් ඉදිකිරීම් සම්බන්ධයෙන් වැඩබිම පරීක්ෂා කිරීම් සඳහා වන මාර්ගෝපදේශ. |
| 6. | CIDA/DEV/14 | - | ගිනි නිවීමේ රෙගුලාසි. |
| 7. | CIDA/DEV/15 | - | විදි පිරි වැර ගැන්වූ කොන්ක්‍රීට් ටැඹ නිර්මාණය කිරීමට, එක් ටැඹක ධාරිතාවය ඇස්තමේන්තු කිරීම සඳහා වන වැඩබිම් පරීක්ෂණ දත්ත අර්ථ නිරූපණය සඳහා වන මාර්ගෝපදේශ. |
| 8. | CIDA/DEV/20 | - | බහු මහල් ගොඩනැගිලි තුළ අභ්‍යන්තර ස්ථාපනයන් (පරිපථ, කේබල් යනාදිය) සඳහා වන මාර්ගෝපදේශ. |
| 9. | CIDA/CM/01 | - | ඵලදායි ඉදිකිරීම් කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශ. |
| 10. | CIDA/SP/102 | - | වාරිමාර්ග හා ඉඩම් ජලාපවාහන සඳහා වන පිරිවිතර. |
| 11. | SCA/3/2 | - | ජලසම්පාදන මළාපවාහන හා තද වැසි හේතුවෙන් ඒකරාශි වූ ජලය අපවහනය සඳහා වන පිරිවිතර. |
| 12. | SCA/3/3 | - | ගොඩකිරීම් කටයුතු සඳහා වන පිරිවිතර. |
| 13. | SCA/3/4 | - | භූගත ජලය ගවේෂණය සහ ප්‍රයෝජනයට යොදා ගැනීම සඳහා වන පිරිවිතර. |
| 14. | SCA/4/I | - | ගොඩනැගිලි වැඩ සඳහා වන පිරිවිතර (I වන වෙළුම). |
| 15. | SCA/4/II | - | ගොඩනැගිලි වැඩ සඳහා වන පිරිවිතර (II වන වෙළුම). |
| 16. | SCA/5 | - | මාර්ග හා පාලම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වන සම්මත පිරිවිතර |
| 17. | SCA/6 | - | වෙරළ හා වරාය ඉංජිනේරු කටයුතු සඳහා වන පිරිවිතර. |
| 18. | SCA/7 | - | භූමි අලංකරණ කටයුතු සඳහා වන පිරිවිතර (I වන වෙළුම). |
| 19. | SCA/8 | - | විද්‍යුත් හා යාන්ත්‍රික කටයුතු සඳහා වන පිරිවිතර. |
| 20. | SCA/9 | - | ගිණි හඳුනා ගැනීමේ, ගින්නෙන් ආරක්ෂා කිරීමේ හා ගිනි මර්දනය කිරීමේ පද්ධති සඳහා වන පිරිවිතර. |
| 21. | CIDA/SP/101 | - | විදි පිරි වැර ගැන්වූ කොන්ක්‍රීට් ටැඹ සඳහා වන පිරිවිතර. |
| 22. | CIDA/DEV/17 | - | ගොඩනැගිලි වැඩ සඳහා වැඩබිම පරීක්ෂා කිරීම සහ ආදර්ශ ප්‍රමාණ බිල්පත්‍රය සඳහා වන පිරිවිතර. |

09 - 131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.